ගුරු සේවා ව්‍යවස්ථාවට අනුකූලව 3වන පන්තියේ ගුරුවරුන්
1 වන හා 11වන කාර්යක්ෂමතා කඩඉම් සඳහා ගුරු අත්පොත

# අංක - 17 අන්තර් පුද්ගල සම්බන්ධතා හා ආකල්ප කුසලතා සංවර්ධනය

සැකසුම

එම්.එෆ්.එන්. හරීජා මිය
එල්.එම්. වංසවතී මෙය

01. මොඩියුලයේ නම - අන්තර් පුද්ගල සම්බන්ධතා හා ආකල්ප කුසලතා සංවර්ධනය

02. අරමුණ - ඵලදායි අන්තර් පුද්ගල සම්බන්ධතා හා ධනාත්මක ආකල්ප ප්‍රදර්ශනය කරමින් ගුරු භූමිකාව ඉටු කරයි.

03. අපේක්ෂිත ඵලය

- ගුරුවරයෙකු පවත්වා ගත යුතු පුද්ගලාන්තර සම්බන්ධතා උදාහරණ දක්වමින් පැහැදිලි කරයි.
- පාසලේ හා සිසුන්ගේ අභිවෘද්ධිය උදෙසා කණ්ඩායම් හැඟීමෙන් යුක්තව කටයුතු කරයි
- ඵලදායි සන්නිවේදන කුසලතා මගින් පුද්ගලාන්තර සබඳතා තහවුරු කර ගත හැකි අවස්ථා පැහැදිළි කරයි
- පුද්ගල හා සමාජ සංවර්ධනය සඳහා ධනාත්මක ආකල්ප වැදගත් වන ආකාරය පැහැදිලි කරයි
- ගුරු ආකල්ප සංවර්ධනයෙහිලා උචිත ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට කැමැත්ත පළ කරයි

04. අන්තර්ගතය

4.1 හැඳින්වීම

පුද්ගලයා හුදෙකලා සත්ත්වයෙකු නොව සමාජ සත්ත්වයෙකි. සමාජයේ ක්‍රියාකාරී ජීවිතයක් ගත කිරීම සඳහා පුද්ගලාන්තර සම්බන්ධතා ගොඩ නංවා ගැනීම, පවත්වා ගැනීම මෙන් ම සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. වැඩ පහසු කරන තාක්ෂණික මෙවලම් අපගේ ජීවිතයට දිනෙන් දින එකතු වුවද, අනෙකුත් අය සමග සබඳතාවලින් තොරව කිසිම මිනිසෙකුට ජීවත්විය නොහැකි ය. එනිසා පුද්ගලාන්තර සම්බන්ධතා මනෝ විද්‍යානුකූලව මූලික මිනිස් ලැදියාවක් වන රංචු ලැදියාව අර්ථවත් කරන්නෙකි. සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයට අනුව එය සමාජානුයෝජනා ක්‍රියාවලියකි.

එමෙන් ම පුද්ගලාන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීමේ දී මෙන් ම ඒවා පවත්වා ගැනීමේ දී ධනාත්මක ආකල්ප වලින් යුක්ත ව කටයුතු කිරීම ද අත්‍යවශ්‍ය වේ. එනිසා පුද්ගලාන්තර සබඳතා ධනාත්මක ආකල්ප එකිනෙක හා තදින් බැඳී පවතින මිනිස් ධර්මතාවයක් ය. මෙම මූලික මිනිස් ධර්මතා සෑම පුද්ගලයෙකුට ම අවශ්‍ය වුවක් වන අතර සෑම ගුරුවරයෙකුට ම ඒවා අත්‍යවශ්‍ය ගුණාංග හා කුසලතා වෙති. මන්ද යත් ගුරුවරයා සමාජය

නිර්මාණය කිරීමේ පුරෝගාමියෙකු ලෙස සැලකෙන බැවිනි. පුද්ගලාන්තර සබඳතා සහ ධනාත්මක ආකල්ප පිළිබඳ ව වන මෙම මොඩියුලයේ මාතෘකාව යටතේ ප්‍රධාන ඉලක්ක කිහිපයක් සපුරා ගැනීම අපේක්ෂිත ය. එනම් පොදුවේ පුද්ගලයකු වශයෙන් පුද්ගලාන්තර සබඳතා සහ ධනාත්මක ආකල්ප වර්ධනයත්, ඵලදායි ගුරුවරයෙකු වශයෙන් එම කුසලතා වර්ධනය කරගත යුතු ආකාරය හඳුනා ගනිමින් තම චරිතාංග හැසිරීම් තුලින් එම කුසලතා සහ ගුණාංග ප්‍රදර්ශනය කරමින් සාර්ථක ගුරුවරයෙකු බවට පත්වීමයි.

## 5.0 අමතර ක්‍රියාකාරකම්

ඔබේ පන්ති කාමරයේ සිසුන්ට පමණක් කඩදාසියක් ලබා දෙන්න. දුම්රියෙන් දිගු ගමණක් යාමට අවස්ථාව ලැබී ඇතැයි සිතා ඒ ගමනේ දී ඔබ එකතුවීමට කැමැති පන්ති කාමරයේ සිටින

1. තමා කැමැතිම ශිෂ්‍යයාගේ /ශිෂ්‍යාවගේ නම
2. දෙවනුවට කැමැති ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ නම
3. තෙවනුවට කැමැති ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ නම සහ තමා අකමැතිම ශිෂ්‍යයාගේ නම ලිවීමට උපදෙස් දෙන්න

සිසුන්ගේ ප්‍රතිචාර එකතු කරගෙන ඒවා විශ්ලේෂණය කරමින් පන්ති කාමරයේ සිසුන්ගේ සම්බන්ධතා රටා හඳුනාගන්න. එම සම්බන්ධතා රටා රූප ඇසුරින් නිර්මාණය කිරීමට උත්සාහ ගන්න. මෙහිදී ශිෂ්‍ය නමට ○ සංකේතය ද, සම්බන්ධතාවන්ට ———— ද යන සංකේත යොදා ගන්න.

අවම සම්බන්ධතා රට පෙන්වන සිසුන් සඳහා සම්බන්ධතා වර්ධනයට යොදා ගතහැකි ක්‍රියාකාරකම් සකස් කර ක්‍රියාත්මක කරන්න. වෙනස්කම් නිරීක්ෂණය කරන්න.

## 6.0 අමතර කියවීම් සඳහා

Wekipedia inter personal relationship, en.wikipedia.org/wiki/interpersonal-relationship

Ekstein Daniel, Eckstein Donna, Lin,Y.F. & Li.C.s (2007) The inter-relationship of encouragement and confrontation skills for on line mentoring, SLTE in Mar 26, 2007 in San Antorio, Texas USA

Yu,T.M. and Zhu C (2011)
Relationship between teachers preferred teacher-student interpersonal behavior and intellectual styles, educational phycology, Vol.31, No.3 May 2011. Routledge

## පාසල තුළ හා පාසලින් බැහැර සබඳතා

### වගුව 1

| පුද්ගල කොට්ඨාසය | පුද්ගල කොට්ඨාසය තුළ සබඳතා දැක්වෙන අවස්ථාවකට නිදසුනක් | වෙනත් පුද්ගල කොට්ඨාස සමග සබඳතා දක්වන අවස්ථාවකට නිදසුනක් |
|---|---|---|
| අංශ ප්‍රධානීන් | කාලසටහනක් සැකසීමේ දී | විදුහල්පති සමග තම අංශයට අවශ්‍ය සම්පත් ලබා ගැනීමේ දී |
| යම්කිසි විෂයයක් සමාන්තර පන්තිවලට උගන්වන ගුරුවරුන් | අදාළ විෂය සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීමේ දී | විෂය ප්‍රධානියා සමග අදාළ විෂය ඉගැන්වීම හා සම්බන්ධ ගැටළු නිරාකරණය කර ගැනීමේ දී |
| විනය පාලන කමිටුව | සිසු විනය පිළිබඳ ව උද්ගත වූ ප්‍රශ්න නිරාකරණයේ දී | පන්ති භාර ගුරුවරුන් සමග යම්කිසි විනය ප්‍රශ්නයකට ආරම්භක හේතු පෙන්වීමේ දී |
| ශිෂ්‍ය නායකයින් | ශ්‍රමදාන ව්‍යාපාරයකට සූදානම් වීමේ දී | නියෝජ්‍ය විදුහල්පති සමග පාසලට ප්‍රමාද ව පැමිණෙන සිසුන් හඳුනා ගැනීමේ දී |
| ඒ ඒ නිවාසවල ක්‍රීඩා නායකයින් | වාර්ෂික ක්‍රීඩා උත්සවයට සූදානම් වීමේ දී | නිවාස භාර ගුරුවරු ජවන හා පිටිය ක්‍රීඩා සඳහා සිසුන් තේරීමේ දී |

### වගුව 2

| සබඳතා | අදාළ ආයතන / පුද්ගලයන් | පාසලට ලබා දෙන ප්‍රයෝජන | පාසලෙන් ලබා ගන්නා ප්‍රයෝජන |
|---|---|---|---|
| පරිපාලන | වැඩිහිටි අධ්‍යාපන නිලධාරී | පාසල් හැර යන්න වුන් සඳහා සුදුසු පාඨමාලා පිළිබඳ තොරතුරු ලබා ගැනීම | වැඩිහිටි අධ්‍යාපන පාඨමාලා සඳහා පාසලේ සම්පත් පරිහරණය කිරීම |
| දේශපාලන | මන්ත්‍රීතුමා | පාසලට අවශ්‍ය ගොඩනැගිලි ලබාදීම | සමාජ සංවර්ධන කටයුතු සඳහා පාසලේ සහයෝගය ලබා ගැනීම |
| සමාජයීය | කර්මාන්ත ශාලා | සිසුන්ට වෘත්තීය කුසලතා ලබාදීම | තම නිපැයුම් ප්‍රදේශවාසීන් අතර ජනප්‍රිය කරවා ගැනීම |

## ගුරු කුසලතා වර්ධනය

ගුරු තොරතුරු සංවර්ධනයේ දී පොදුවේ ගුරුවරයා තුළ වර්ධනය කරගත යුතු කුසලතා මෙන් ම පූර්ව ළමාවිය ගුරුවරිය විසින් වර්ධනය කරගත යුතු කුසලතා මෙහිදී විමර්ශනයට ලක්වේ.

කුසලතාව (Skill) යනු කුමක් ද ?

- සුවිශේෂී වූ කාර්යයක් ඉටුකිරීම සඳහා යොදා ගන්නා ලද සුමට ලෙස සංවර්ධනය වූ චලන ශ්‍රේණියකි. (Travers)
- කුසලතා යනු චාලක ප්‍රතිචාර වැලකි (Cecco)

මේ අනුව කුසලතාවක ප්‍රධාන අංග ලක්ෂණ කිහිපයක් දැකිය හැකිය

- පේශීමය චලනයේ සකසුරුවම්භාවය, වේගවත් බව
- කාලය තැබීම, විශ්වසනීයත්වය, ආත්ම විශ්වාසය

## ආකල්ප සංවර්ධනය හා ධනාත්මක ආකල්ප


ආකල්ප යනුවෙන් අදහස් කරන්නේ පුද්ගලයෙකු යම් දෙයක් / වස්තුවක් / තවත් පුද්ගලයෙකු / කණ්ඩායම් අවස්ථාවක් සම්බන්ධව දරනු ලබන මානසික ස්වභාවය හෙවත් ස්ථාවරයයි. බොහෝ විට එය ස්ථිර හා දිගුකාලීන ස්වභාවයක් දරයි

### ආකල්ප ඇතිවන ආකාරය

i. අවට පරිසරයේ ජීව / අජීව විවිධ වස්තූන් සංසිද්ධීන් පිළිබඳ ව සංජානනය කිරීම
ii. ඒ තුළින් අදහස් මත විශ්වාස වටිනාකම් ගොඩනැගීම
iii. එම වටිනාකම් තම දර්යාවෙන් ප්‍රදර්ශනය කිරීම

### නිර්වචනය


ආකල්ප යනු අත්දැකීම් වල දළ ඉතිරිවීමක් වන අතර ඒවා තවදුරටත් තත්වාරෝපණය හා පාලනය වීම සිදුවේ. පුද්ගලයෙකු යම් වස්තුවකට හෝ අවස්ථාවකට ප්‍රතිචාර දැක්වීමේ මග පෙන්වනු ලබන හෝ ගතික බලපෑමක් ඇති කරනු ලබන අත්දැකීම් තුළින් සංවිධානය වන මාසික හා ස්නායුමය සූදානම පිළිබඳ තත්ත්වයකි (ඕල්පොට්)




ඒ අනුව ආකල්පයක ප්‍රධාන අංග තුනක් අන්තර්ගත වන බව

1. අත්දැකීම් තුළින් සංවිධානය
2. ගතික / සක්‍රීය බලපෑමක්
3. මානසික / ස්නායුමය සූදානම

ආකල්පයක් ඇතිවන ආකාරය



**ආකල්ප දෙයාකාරයක ස්වරූපයක් ගනී**

එකඟවීම ⟷ එකඟ නොවීම

කැමතිවීම ⟷ අකැමැතිවීම

කිරීම ⟷ නොකිරීම

ගුරු ආකල්ප සංවර්ධනය

- ගුරුවරයා ඍජුව ළමුන් සමග ක්‍රියාකරන්නෙකි. භාණ්ඩ කැඩුණොත් පිළිසකර කරගත හැකිය. භාණ්ඩයකට භාණ්ඩයක් ආදේශ කළ හැකිය. එහෙත් සජීවී ළමා පරපුර විනාශයකට / අඩාලවීමකට ලක් නොවන අයුරින් කටයුතු කිරීමට නම් ගුරු ආකල්ප ඉතා වැදගත් වේ.
- ඕනෑම ආයතනයක / සමාජයක වගකීම් දරන්නේ මිනිස් සම්පතයි. ආයතනය සතු මානව හා භෞතික සම්පත් හොඳින් හඳුනාගැනීමටත් ඒවායින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි ක්‍රමවේද තීරණය කිරීමටත් මෙහෙයවිය හැකි බුද්ධියක් මිනිස් සම්පත සතුව පැවතිය යුතු ය. එසේ ම අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනිමින් මානව කටයුතු මෙහෙයවා ගැනීම ද කළයුතු වන්නේ ය. මෙම ශක්තීන් පුද්ගලයා තුළ වර්ධනය කිරීමට ගුරුවරයා තුළ ධනාත්මක ආකල්ප සංවර්ධනය වීම අත්‍යවශ්‍ය ය.

**ආකල්ප යහපත් කර ගැනීමේ මාර්ග සහ ක්‍රම**

- වෙනසක් ඇති කළහැකි යැයි සිතන්න
  - මා අන් අයගේ සුවිශේෂ කෙනෙකු යැයි සිතන්න
  - මට බොහෝ දේ වෙනස් කළහැකි බව සිතන්න
  - මා යමක් වෙනස් කිරීමට පෙර මා වෙනස් විය යුතු බව සිතන්න

- කියන දේ ගැන දෙවරක් සිතන්න
  - අනුන් ගැන වැරදි කීමට වඩා හොඳ කීමට ඇත්දැයි සිතන්න
  - කියන දෙයින් තව කෙනෙකුගේ සිත රිදේවි දැයි සිතන්න
  - කියන දෙයින් ආයතනික කටයුතුවලට බාධාවක් හෝ නොගැළපීමක් සිදුවේ දැයි සිතන්න
  - තමා උපමා කොට ගෙන සිතන්න

- තමා ගැනම සිතන්න
  - මගේ රැකියාව පිළිබඳ මගේ ආකල්පය හොඳ ද ?
  - මගේ රැකියාවට අදාළ කටයුතු සියල්ල දන්නවා ද ?
  - එම කටයුතු සියල්ල ම දිනපතා මා හොඳින් ඉටු කරනවා ද ?
  - කවුරුන් හෝ කියන තෙක් නොසිට මගේ කටයුතු මැනවින් ඉටු කරනවා ද ?
  - මා වැඩි කාලයක් ගත කරන මගේ ආයතනයේ දියුණුව මගේ දියුණුවට ද අනියමින් බලපායි. එසේ නම් මගේ ආයතනයට මා ආදරය කරන්නේ ද ?
  - ආයතනයේ අරමුණු මා තේරුම් ගෙන තිබේ ද ?
  - ආයතනයට ගැලපෙන ලෙස මා වෙනස් වී තිබේ ද ?
  - මගේ ශක්ති ප්‍රමාණයෙන් කැප වී කටයුතු කිරීමට මා එකඟ වී සිටින්නේ ද ?
  -

- අභිමානවත් ව සිතන්න
  - මට යමක් කළහැකි යැයි සිතන්න
  - සතුට, ආත්ම විශ්වාසය, මගේ ශක්තිය බව සිතන්න
  - කිත් පැසසුම් නොලැබුණත් ආත්ම තෘප්තිය මට ඇති බව සිතන්න
  - කිසිවෙකුට මා දෙවෙනි විය යුතු නැත
  - කුමක් කළත් ඉස්තරම් ලෙසින් කිරීමට සිතන්න
  - ඇයි මට බැරි යැයි සිතන්න
  -

- අනුන් විවේචනය නොකරන්න
  - අඩුපාඩු දුර්වලතා කා වෙතත් ඇතැයි සිතන්න
  - මටත් වැරදි සිදුවෙතැයි පිළිගැනීමට පුරුදු වන්න
  - වැරැද්දකදී වැරදිකරුවා හෙළා දැකීමට වඩා එය පාඩමක් කොට ගෙන ඔහු ඔසවා තැබීමට හැකි දැයි සිතන්න
  -

- නිහතමානී වන්න
  - තමාගේ තනතුර, වැටුප, උපත, කුලය ගැන සිතීමට පුරුදු නොවන්න
  - උඩඟුකම විනාශයට මුල බව සිතන්න
  - මිනිස්කම හඳුනාගෙන හැකි හැම කෙනෙකුට ම හැමවිටම උපකාරී වීමට පුරුදු වන්න
  - පරාර්ථකාමීව සිතන්න

- කණ්ඩායමක් ලෙසින් සිතන්න, වැඩ කරන්න
    - කණ්ඩායමක් ලෙස වැඩ කිරීමට ලැබීම ගැන සතුටු වන්න
    - තම කණ්ඩායමේ සාමාජිකයන්ගේ හොඳ ගතිගුණ මෙනෙහි කරන්න
    - අනුන්ගේ වැරදි අමතක කළ නොහැකි ඒවාම දැයි සිතන්න
    - අමතක කළ නොහැකි ම ඒවා නම් ඉදිරියට ගොස් විවෘතව කථා කරන්න
    - සැකය, හිතවත්කම් අත්හරින හෙයින් ඒවා පළවා හරින්න
    - කේලාම් බස් නොපිළිගන්න
    - හදවත විවෘතව තබා ගන්න
    - විවෘතව කථා කරන්න
    - කණ්ඩායමට හා නැතිවම බැරි යයි සිතන්න
    - කණ්ඩායමේ කොටස්කරුවෙකු ලෙස මගේ කාර්යය මෙනෙහි කරන්න. එය නොපිරිහෙලා ඉටු කරන්න
    -
- ඉලක්කයක් ඇතිව කටයුතු කරන්න
    - ජීවිතයේ අරමුණු තීරණය කරන්න
    - මගේ සංවර්ධනය ආයතනයේ සංවර්ධනය බව සිතන්න
    - මගෙන් මට ඇති ප්‍ර යෝජන සහ ආයතනයට ඇති ඵලය පිළිබඳ සිතන්න
    - වැඩ කටයුතු හොඳින් සැලසුම් කරන්න
    - වැඩ කටයුතු හොඳින් මෙහෙය වන්න
    - හොඳ අදහස්, හොඳ වැඩ තුළින හොඳ ප්‍රතිඵල ලැබේ
    - තමා ගැන තමා ම ආඩම්බර වන්න
    -
- නිවැරදි මාර්ගය තෝරා ගෙන කටයුතු කරන්න
    - නිවැරදි මාර්ගය තීරණය කරන්න
    - අවශ්‍ය නම් අනුන්ගේ ආධාර ලබා ගන්න. එය මට ධෛර්යකැයි සිතන්න
    - අනුන්ගේ සුළු හෝ දොසක් ඇසීමට ඉඩ නොතබන්න. එහෙත් සාධාරණ විවේචන පිළිගන්න
    - උතුම් මිනිස් ගුණ මොනවා දැයි සිතන්න
    - ඒවා තමාට හුරු කරගන්න. අද එකක්, තව සතියකින් තව එකක් වශයෙන් හුරු වන්න
    - ආදර්ශයට ගතහැකි අය ගැන සිතන්න. ආදර්ශයට ගන්න